# 2023.11.14 ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේදී අනුගමනය කළ යුතු උපදෙස් මාලාව

## අදියර 01 - උදේ වරුව

01 ඔබ මෙම උත්සවය සඳහා සහභාගී විය යුතු අදියර (උදේ/සවස) , ආසන අංකය , සහ ආරාධනා පත්‍රය ඔබ විසින් යොමු කර ඇති දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් ඔබ වෙත යොමු කෙරේ. එලෙස ඔබ වෙත යොමු කෙරන Web Link මගින් එම ආසන අංකය සහ ආරාධනා පත්‍රය බාගත කර (Download) එහි මුද්‍රිත පිටපතක් ලබා ගන්න.

02 විදුහල්පති/අධ්‍යක්ෂ / ලෝගු භාරගන්නා නිලධාරියා 2023.11.14 වන දින පෙ.ව.6.30 ට පෙර BMICH ප්‍රධාන ශාලාවට පැමිණිය යුතු අතර සිසුන්ගේ ලෝගු විද්‍යාල මට්ටමෙන් අවශ්‍ය ප්‍රමාණයට අධ්‍යක්ෂ /විදුහල්පති හෝ ලෝගු භාර නිලධාරියා විසින් භාර ගෙන පෙ.ව.7.30 ට පෙර සිසුන්ට බෙදා අවසන් කළ යුතු අතර උත්සවය අවසානයේ ඒ සියල්ල එකතු කර අධ්‍යක්ෂ / විදුහල්පති / ලෝගු භාර නිලධාරියා විසින් අදාළ නිලධාරීන් වෙත භාර දිය යුතුය.
සෑම ඩිප්ලෝමාලාභියෙක්ම තමන්ට හිමි ලෝගුව ලබා ගැනීමෙන් පසු 0711388682 යන දුරකථන අංකයට Dip< Space> NIC ලෙස කෙටි පණිවිඩයක් (SMS) යොමු කර පැමිණීම තහවුරු කළ යුතුය.

ඉතා වැදගත්

**මෙම ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ සියලුම ඩිප්ලෝමාලාභීන් වෙත ලබා දෙන ලෝගු මෙම දෙපාර්තමේන්තුව මගින් කුලී පදනම මත ලබා ගෙන ඇත. එමනිසා කිසිදු හේතුවක් මත ඩිප්ලෝමා ලාභීන්ට එම ලෝගු බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයෙන් පිටතට රැගෙන යාමට නොහැකි බවට තරයේ අවවාද කරමි. සෑම ඩිප්ලෝමාලාභියෙක්ම තමන්ගේ ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය අදාළ ලෝගු භාර නිලධාරියාට භාර දී අදාළ ලේඛනයේ අත්සන තබා ලෝගුව ලබා ගෙන නැවත ලෝගුව භාර දීමෙන් පසු අදාළ ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය නිදහස් කර ගැනීම සිදු කළ යුතුය.**
**කිසියම් ඩිප්ලෝමාලාභියෙක් අදාළ නීති කඩකරමින් ලෝගුව BMICH පරිශ්‍රයෙන් බැහැර ගෙන ගියහොත් පවතින සිවිල් නීතියට අනුව දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරන බවද අවධාරණය කර සිටිමි.**

03 ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ පෙරහුරුව පෙ.ව.7.30 ට ආරම්භ කරන බවත් ඉන් පසුව පැමිණෙන අය <u>සහතික පත්‍ර ප්‍රදානෝත්සවය සඳහා සහභාගී කරවීමට නොහැකි වන බව</u> දන්වන අතර උත්සවය අවසානයේ සමූහ ඡායාරූපයට පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

04 මෙම උත්සවයේ සිසුන් සහතිකපත් ලබා ගන්නා අවස්ථාව සහ අනෙකුත් සියලුම ඡායාරූප ගැනීමේ කටයුතු Ninehearts (PVT) Ltd ආයතනය වෙතින් සිදු කරන අතර ඊට , අදාළ ගාස්තු ඇතුළත් ලේඛනය මේ සමග එවා ඇත. ඒ අනුව ඡායාරූප ගැනීමේ කටයුතු එම ආයතනය සමග සිසුන් විසින් පෞද්ගලිකව සිදු කළයුතුවේ.ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුව කිසිදු ආකාරයක මැදිහත් වීමක් සිදු නොකරන බවද සැලකිය යුතුය. ඡායාරූප ලබා ගැනීම සඳහා මාර්ගගත ක්‍රමයට මෙම වෙබ් සබැඳුමෙන් ලියාපදිංචි විය හැකිය. http://convocation.ninehearts.com/event/ZXCV8

ලියාපදිංචි වීමේදී ඔබගේ ආසන අංකයට පිටුපසින් 'M' අක්ෂරය යොදන්න.
උදා: 1M, 59M

05 උත්සවයේදී ලබා දෙන මන්ජුසාව සිසුන්ට තබා ගත හැකිය.

06 සිසුන් වැඩි ප්‍රමාණයකට අවස්ථාව සලසා දී ඇති බැවින් ශාලා පරිශ්‍රයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් මෙවර ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වෙන BMICH ප්‍රධාන ශාලාව තුළට කිසිදු දෙමව්පියෙකු හෝ භාරකරුවෙකු ඇතුළත් කර නොගැනෙන අතර ප්‍රධාන ශාලාව ආසන්නයේ පිහිටා ඇති සිරිමාවෝ බණ්ඩාරනායක ශාලාව තුළ දෙමාපියන් සහ භාරකරුවන් සඳහා අසුන් ගැනීමට කටයුතු සලසා ඇති අතර උත්සව අවස්ථාව සජීවී පුළුල් තිරයක් මගින් එම ස්ථානයේ සිට නැරඹීමට හැකියාව ඇත.

07 ආරක්ෂක හේතූන් මත කිසිදු ගමන් බෑගයක් සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයට රැගෙන යාමට ඉඩ දෙනු නොලැබේ. සිසුන් ජාතික හැඳුනුම්පත් සහ අප විසින් නිකුත් කරනු ලබන විශේෂ ප්‍රවේශපත් ආරක්ෂක අංශවලට ඉදිරිපත් කර අදාළ පරීක්ෂාවන්ට ලක් විය යුතුය.

08 අධ්‍යක්ෂ/ විදුහල්පති හා සහභාගිවන ආචාර්යවරුන් සම්පූර්ණ ඇඳුමින් (Full Dress) සැරසී පැමිණිය යුතුය.

09 ශිෂ්‍යයන් සම්පූර්ණ යුරෝපීය ඇඳුමින් හා ශිෂ්‍යාවන් සාරියකින් හෝ ඔසරියකින් උත්සවාකාරයෙන් සැරසිය යුතු අතර , කොණ්ඩය මුදා හැරීමෙන් වැළකී සිටිය යුතුය.

10 උත්සව ශාලාවට ඇතුළු වූ පසු එය සමාප්ත වන තුරු රැඳී සිටිය යුතු අතර ප්‍රධාන අමුත්තන් ශාලාවට ඇතුල් වීමේ දී හා පිට වීමේ දී සියලුදෙනා තම ආසන වලින් නැගී සිටිය යුතුය.

11 උත්සවය පැවැත්වෙන අවස්ථාවේ දී ශාලාව තුළ එහා මෙහා ඇවිදීම හා දුරකථන භාවිතය හා සෙල්ෆි ඡායාරූප ගැනීම සපුරා තහනම් වේ.

12 උදේ සහ සවස සහභාගී වන සෑම සිසුවෙක් සඳහා මෙන්ම කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාරය සපයනු ලැබේ.

**මෙම ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට සහභාගීවන කිසිදු ඩිප්ලෝමාලාභියෙකුට තමන් සහභාගීවන අදියර අවසන් වන තෙක් කිසිදු හේතුවක් මත ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සිදුවන ප්‍රධාන ශාලා පරිශ්‍රයෙන් පිටතට යාමට ඉඩදෙනු නොලැබේ. එම නිසා ඒ පිළිබඳව සංවිධායක මණ්ඩලයෙන් ඉල්ලීම් කිරීමෙන් වළකින ලෙස අවධාරණය කරනු ලැබේ.**

ආර්.බී.ගුරුගේ
අධ්‍යක්ෂ (පරීක්ෂණ හා ඇගයීම්) ,
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

ආර්.බී.ගුරුගේ
අධ්‍යක්ෂ (පරීක්ෂණ හා ඇගයීම්)
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
ඕල්කට් මාවත
කොළඹ 10.

# 2023.11.14 ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේදී අනුගමනය කළ යුතු උපදෙස් මාලාව

## අදියර 02 - සවස් වරුව

01 ඔබ මෙම උත්සවය සඳහා සහභාගී විය යුතු අදියර (උදේ/සවස) , ආසන අංකය , සහ ආරාධනා පත්‍රය ඔබ විසින් යොමු කර ඇති දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් ඔබ වෙත යොමු කෙරේ. එලෙස ඔබ වෙත යොමු කෙරන Web Link මගින් එම ආසන අංකය සහ ආරාධනා පත්‍රය බාගත කර ගැනීමට (Download) කර එහි මුද්‍රිත පිටපතක් ලබා ගන්න.

02 විදුහල්පති/අධ්‍යක්ෂ / ලෝගු භාරගන්නා නිලධාරියා 2023.11.14 වන දින පෙ.ව.10.00 ට පෙර BMICH ප්‍රධාන ශාලාවට පැමිණිය යුතු අතර සිසුන්ගේ ලෝගු විද්‍යාල මට්ටමෙන් අවශ්‍ය ප්‍රමාණයට අධ්‍යක්ෂ /විදුහල්පති හෝ ලෝගු භාර නිලධාරියා විසින් භාර ගෙන පෙ.ව.10.30 ට පෙර සිසුන්ට බෙදා අවසන් කළ යුතු අතර උත්සවය අවසානයේ ඒ සියල්ල එකතු කර අධ්‍යක්ෂ / විදුහල්පති / ලෝගු භාර නිලධාරියා විසින් අදාළ නිලධාරීන් වෙත භාර දිය යුතුය.

සෑම ඩිප්ලෝමාලාභියෙක්ම තමන්ට හිමි ලෝගුව ලබා ගැනීමෙන් පසු 0711388682 යන දුරකථන අංකයට Dip< Space> NIC ලෙස කෙටි පණිවිඩයක් (SMS) යොමු කර පැමිණීම තහවුරු කළ යුතුය.

ඉතා වැදගත්

**මෙම ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ සියලුම ඩිප්ලෝමාලාභීන් වෙත ලබා දෙන ලෝගු මෙම දෙපාර්තමේන්තුව මගින් කුලී පදනම මත ලබා ගෙන ඇත. එමනිසා කිසිදු හේතුවක් මත ඩිප්ලෝමා ලාභීන්ට එම ලෝගු බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයෙන් පිටතට රැගෙන යාමට නොහැකි බවට තරයේ අවවාද කරමි. සෑම ඩිප්ලෝමාලාභියෙක්ම තමන්ගේ ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය අදාළ ලෝගු භාර නිලධාරියාට භාර දී අදාළ ලේඛනයේ අත්සන තබා ලෝගුව ලබා ගෙන නැවත ලෝගුව භාර දීමෙන් පසු අදාළ ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය නිදහස් කර ගැනීම සිදු කළ යුතුය.**

**කිසියම් ඩිප්ලෝමාලාභියෙක් අදාළ නීති කඩකරමින් ලෝගුව BMICH පරිශ්‍රයෙන් බැහැර ගෙන ගියහොත් පවතින සිවිල් නීතියට අනුව දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරන බවද අවධාරණය කර සිටිමි.**

03 ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ පෙරහුරුව පෙ.ව.11.30 ට ආරම්භ කරන බවත් ඉන් පසුව පැමිණෙන අය <u>සහතික පත්‍ර ප්‍රදානෝත්සවය සඳහා සහභාගී කරවීමට නොහැකි වන බව</u> දන්වන අතර උත්සවය අවසානයේ සමූහ ඡායාරූපයට පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

04 මෙම උත්සවයේ සිසුන් සහතිකපත් ලබා ගන්නා අවස්ථාව සහ අනෙකුත් සියලුම ඡායාරූප ගැනීමේ කටයුතු Ninehearts (PVT) Ltd ආයතනය වෙතින් සිදු කරන අතර ඊට , අදාළ ගාස්තු ඇතුළත් ලේඛනය මේ සමග එවා ඇත. ඒ අනුව ඡායාරූප ගැනීමේ කටයුතු එම ආයතනය සමග සිසුන් විසින් පෞද්ගලිකව සිදු කළයුතුවේ.ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුව කිසිදු ආකාරයක මැදිහත් වීමක් සිදු නොකරන බවද සැලකිය යුතුය. ඡායාරූප ලබා ගැනීම සඳහා මාර්ගගත ක්‍රමයට මෙම වෙබ් සබැඳුමෙන් ලියාපදිංචි විය හැකිය. <u>http://convocation.ninehearts.com/event/ZXCV8</u>

ලියාපදිංචි වීමේදී ඔබගේ ආසන අංකයට පිටුපසින් 'E' අක්ෂරය යොදන්න.
උදා: 2E, 1170E

05 උත්සවයේදී ලබා දෙන මන්ජුසාව සිසුන්ට තබා ගත හැකිය.

06 සිසුන් වැඩි ප්‍රමාණයකට අවස්ථාව සලසා දී ඇති බැවින් ශාලා පරිශ්‍රයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් මෙවර ගෙන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වෙන BMICH ප්‍රධාන ශාලාව තුළට කිසිදු

දෙමව්පියෙකු හෝ භාරකරුවෙකු ඇතුළත් කර නොගැනෙන අතර ප්‍රධාන ශාලාව ආසන්නයේ පිහිටා ඇති සිරිමාවෝ බණ්ඩාරනායක ශාලාව තුළ දෙමාපියන් සහ භාරකරුවන් සඳහා අසුන් ගැනීමට කටයුතු සලසා ඇති අතර උත්සව අවස්ථාව සජීවීව පුළුල් තිරයක් මගින් එම ස්ථානයේ සිට නැරඹීමට හැකියාව ඇත.

07 ආරක්ෂක හේතූන් මත කිසිදු ගමන් බෑගයක් සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයට රැගෙන යාමට ඉඩ දෙනු නොලැබේ. සිසුන් ජාතික හැඳුනුම්පත් සහ අප විසින් නිකුත් කරනු ලබන විශේෂ ප්‍රවේශපත් ආරක්ෂක අංශවලට ඉදිරිපත් කර අදාළ පරීක්ෂාවන්ට ලක් විය යුතුය.

08 අධ්‍යක්ෂ/ විදුහල්පති හා සහභාගිවන ආචාර්යවරුන් සම්පූර්ණ ඇඳුමින් (Full Dress) සැරසී පැමිණිය යුතුය.

09 ශිෂ්‍යයන් සම්පූර්ණ යුරෝපීය ඇඳුමින් හා ශිෂ්‍යාවන් සාරියකින් හෝ ඔසරියකින් උත්සවාකාරයෙන් සැරසිය යුතු අතර , කොණ්ඩය මුදා හැරීමෙන් වැළකී සිටිය යුතුය.

10 උත්සව ශාලාවට ඇතුළු වූ පසු එය සමාප්ත වන තුරු රැඳී සිටිය යුතු අතර ප්‍රධාන අමුත්තන් ශාලාවට ඇතුල් වීමේ දී හා පිට වීමේ දී සියලුදෙනා තම ආසන වලින් නැගී සිටිය යුතුය.

11 උත්සවය පැවැත්වෙන අවස්ථාවේ දී ශාලාව තුළ එහා මෙහා ඇවිදීම හා දුරකථන භාවිතය හා සෙල්ෆි ඡායාරූප ගැනීම සපුරා තහනම් වේ.

12 උදේ සහ සවස සහභාගී වන සෑම සිසුවෙක් සඳහා මෙන්ම කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාරය සපයනු ලැබේ.

**මෙම ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට සහභාගීවන කිසිදු ඩිප්ලෝමාලාභියෙකුට තමන් සහභාගීවන අදියර අවසන් වන තෙක් කිසිදු හේතුවක් මත ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සිදුවන ප්‍රධාන ශාලා පරිශ්‍රයෙන් පිටතට යාමට ඉඩදෙනු නොලැබේ. එම නිසා ඒ පිළිබඳව සංවිධායක මණ්ඩලයෙන් ඉල්ලීම් කිරීමෙන් වළකින ලෙස අවධාරණය කරනු ලැබේ.**

ආර්.බී.ගුරුගේ
අධ්‍යක්ෂ (පරීක්ෂණ හා ඇගයීම්) ,
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

# 2023.11.14 ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේදී ලෝගු බෙදා හැරීමේ දී සහ භාර ගැනීමේ දී කාර්මික/තාක්ෂණ විද්‍යාල විසින් අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ පොදු උපදෙස් මාලාව

1 පසුගිය ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයක දී ලෝගු කිහිපයක් අස්ථානගත වීම සැළකිල්ලට ගෙන ලෝගු බෙදා හැරීම සහ ලෝගු භාර ගැනීම පිළිබඳ පූර්ණ වගකීම අධ්‍යක්ෂ/ විදුහල්පති සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු විසින් දැරිය යුතු බවට තීරණය කර ඇත.

2 මෙම ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ සියලුම ඩිප්ලෝමාලාභීන් වෙත ලබා දෙන ලෝගු මෙම දෙපාර්තමේන්තුව මගින් කුලී පදනම මත ලබා ගෙන ඇත. එමනිසා කිසිදු හේතුවක් මත ඩිප්ලෝමා ලාභීන්ට එම ලෝගු බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයෙන් පිටතට රැගෙන යාමට නොහැකි බවට සිසුන්ට ලබා දෙන උපදෙස් පත්‍රිකාවේ අවවාද කර ඇත. . සෑම ඩිප්ලෝමාලාභියෙක්ම තමන්ගේ ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය අදාළ ලෝගු භාර නිලධාරියාට භාර දී අදාළ ලේඛනයේ අත්සන තබා ලෝගුව ලබා ගෙන නැවත ලෝගුව භාර දීමෙන් පසු අදාළ ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය නිදහස් කර ගැනීම සිදු කළ යුතුය.

3 එමනිසා සිසුන්ගේ ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය භාර ගෙන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය අවසානයේ ආපසු නිදහස් කිරීමේ දී ඇතිවන තදබදය වළක්වා ගැනීම සඳහා ඩිප්ලෝමාලාභියාගේ ආසන අංකය ජාතික හැඳුනුම්පත/ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයට අමුණා ගැනීමට හැකි ක්‍රමවේදයක් සකසා ගෙන පැමිණීම සුදුසු වේ.

4 උත්සව දිනයේ අදාළ නිලධාරීන් සම්මන්ත්‍රණ ශාලාවට පැමිණෙන විට එක් එක් කාර්මික /තාක්ෂණ විද්‍යාලය නියෝජනය කරමින් ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට සහභාගී වන ඩිප්ලෝමාලාභීන්ගේ ලේඛනයක් , ලෝගු බෙදා හැරීමේ දී සහ භාර ගැනීමේ දී අත්සන යෙදිය හැකි ආකාරයට සකසා රැගෙන ආ යුතුය.

5 උදේ වරුවේ පැවැත්වෙන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට අදාළ කාර්මික/තාක්ෂණ විද්‍යාලයන්හි විදුහල්පති/අධ්‍යක්ෂ / ලෝගු භාරගන්නා නිලධාරියා 2023.11.14 වන දින පෙ.ව.6.30 ට පෙර BMICH ප්‍රධාන ශාලාවට පැමිණිය යුතු අතර සිසුන්ගේ ලෝගු විද්‍යාල මට්ටමෙන් අවශ්‍ය ප්‍රමාණයට අධ්‍යක්ෂ /විදුහල්පති හෝ ලෝගු භාර නිලධාරියා විසින් භාර ගෙන පෙ.ව.7.30 ට පෙර සිසුන්ට බෙදා අවසන් කළ යුතු අතර උත්සවය අවසානයේ ඒ සියල්ල එකතු කර අධ්‍යක්ෂ / විදුහල්පති / ලෝගු භාර නිලධාරියා විසින් අදාළ නිලධාරීන් වෙත භාර දිය යුතුය.

6 සවස් වරුවේ පැවැත්වෙන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට අදාළ කාර්මික/තාක්ෂණ විද්‍යාලයන්හි විදුහල්පති/අධ්‍යක්ෂ / ලෝගු භාරගන්නා නිලධාරියා 2023.11.14 වන දින පෙ.ව.10.00 ට පෙර BMICH ප්‍රධාන ශාලාවට පැමිණිය යුතු අතර සිසුන්ගේ ලෝගු විද්‍යාල මට්ටමෙන් අවශ්‍ය ප්‍රමාණයට අධ්‍යක්ෂ /විදුහල්පති හෝ ලෝගු භාර නිලධාරියා විසින් භාර ගෙනපෙ.ව.10.30 ට පෙර සිසුන්ට බෙදා අවසන් කළ යුතු අතර උත්සවය අවසානයේ ඒ සියල්ල එකතු කර අධ්‍යක්ෂ / විදුහල්පති / ලෝගු භාර නිලධාරියා විසින් අදාළ නිලධාරීන් වෙත භාර දිය යුතුය

7 උත්සව අවසානයේ උපදෙස් කඩකරමින් කිසියම් ඩිප්ලෝමාලාභියෙක් ලෝගුව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවෙන් පිටතට රැගෙන ගොස් අස්ථානගත කිරීමක් සිදුවුහොත් අදාළ ඩිප්ලෝමාලාභියාට එරෙහිව නීති මගින් කටයුතු කිරීම සඳහා එම ඩිප්ලෝමාලාභියාගේ නම / කාර්මික තාක්ෂණ විද්‍යාලය/ ලිපිනය / ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළු තොරතුරු අධ්‍යක්ෂ (පරීක්ෂණ හා ඇගයීම් ) වෙත පැහැදිලිව ලිඛිතව ලබා දිය යුතුය.

8 මෙම කාර්ය සඳහා ඔබ විසින් දැනටමත් නිර්දේශ කර ඉදිරිපත් කර ඇති නිලධාරීන් සඳහා අවශ්‍ය ආහාර සහ පාන උත්සව දිනයේ දී සැපයීමට අවශ්‍ය කටයුතු සලසා ඇත.

ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.බී.ගුරුගේ

අධ්‍යක්ෂ (පරීක්ෂණ හා ඇගයීම්)

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

**ආර්.බී.ගුරුගේ**
අධ්‍යක්ෂ (පරීක්ෂණ හා ඇගයීම්)
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
ඕල්කට් මාවත
කොළඹ 10.